ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 නොවැම්බර් 04 සඳුදා
06 වෙළුම - 01 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## කිතුනු දරුවන් වෙනුවෙන් මුද්‍රිත මාධ්‍යයේ පස් වසරක අසමසම ධර්මදූත මෙහෙවර

## 'ළමා ප්‍රදීපය'

Photos By: ASHEN S. SENARATHNA SLC

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# "ළමා ප්‍රදීපය" ඉදිරිය බලා තවත් ගමනක් අරඹලා

## ආදරණීය දුවේ පුතේ...

''ළමා ප්‍රදීපය'' සිය ගමන් මඟ තුළ පස් වන වසර හමාර කරනවා. කලින් ''ඥානාර්ථ ප්‍රදීපය'' සමඟ ඔබ අතට පත් වුනු ''ළමා ප්‍රදීපය'' තනි පුවත්පතක් වශයෙන් ආරම්භ කරලා දැන් පස් වෙනි වසරත් හමාර කර අවසන්. දැන් තනිව යන ගමනක හොඳ පන්නරයක් ලබා ගන්න ''ළමා ප්‍රදීපයට'' හැකියාව තිබෙනවා. එහි ප්‍රගතිය පිළිබඳව අපි මෑතකදී කළ කරුණු සමාලෝචනය හා මත විමසුම තුළදී අත් විඳින්නට හැකිවුනෙත් ඉතාම ඵලදායි ප්‍රතිඵලයක්.

ආදර දුවේ පුතේ, කතෝලික පුවත්පතක් ලෙස ළමා ප්‍රදීපය ජීවත් කරවන්නේ කතෝලික ළමා ඔබයි. එය ජීවමාන කරන්නෙත් අපගේ ළමා ලේඛක පරපුරයි. එහි හොඳ නරක, ගුණ අගුණ, විවේචනාත්මක ඇසින් බලා තීරණය කරන්නෙත් ළමා ඔබයි. මේ සියල්ල තුළින්ම ගුණාත්මක ගමනක් යෑමට ළමා ප්‍රදීපයට කදිම මඟක් දැන් විවෘත වී තිබෙනවා.

ආදර දුවේ පුතේ, ''ළමා ප්‍රදීපයට'' පස් වසර සපිරෙනවාත් සමඟම තවත් සුබ මතක් කිරීමක් ඔබට කරන්න තිබෙනවා. තවත් වසර දෙකකින් එහි මව් පුවත් පත වන ඥානාර්ථ ප්‍රදීපය සිය 150 සංවත්සරය සමරන්නට සූදානම් වෙනවා. කතෝලික මුද්‍රණාලයෙන් එළි බට ලන මේ පුවත්පත් දෙක ඇතුළුව ''messenger'' ඉංග්‍රිසි පුවත්පතත්, ඥාන ඔළී, දෙමළ පුවත්පතත් අද ශ්‍රී ලංකාවේ කතෝලික විඥානය සකසා ලන්නට මහඟු මෙහෙවරක් ඉටු කොට තිබෙනවා.

හැබැයි ඒ සමස්තයේ ඉදිරි පුරෝගාමීන් බවට පත්විය යුත්තේ පාඨක ඔබ සැමයි. පාඨක හා ලේඛක ළමා ළපටින් මෙන්ම වැඩිහිටි අප සහෝදර සහෝදරියන් දහමේ ආහාෂය ලබා පන්නරය ලබන තාක් හොඳ පරිණත මනස කින් මෙහි දයකත්වය සම්පූර්ණයෙන්ම පෝෂණය කරන බව අමතක කරන්න බැහැ.

ඉතින් ආදර දුවේ පුතේ, ඥානාර්ථ ප්‍රදීපයේ 150 වෙනි සංවත්සරයට සමගාමීව අපි දියත් කරන්නට බලාපොරොත්තු වන වැඩ සටහන් අතරට ළමා ප්‍රදීපයේ අපගේ පාඨක ලේඛක ළමා කැලටත් හොඳ වැඩදයි විධිමත් අවස්ථාවක් ලබා දෙන්නට අපි සූදනම්

ආදර දුවේ පුතේ, කතෝලික ළමා ලේඛක පර පුරක් බිහිකිරීමේ මූලික අදියරක් හැටියට මාධ්‍ය වැඩමුළු කිහිපයක් තුළින් ඉදිරියේදී ඔබව දැනුම්වත් කරලා ඔබේ වටිනා නිර්මාණ අතරින් හොඳ පොත් කිහිපයක්ම පල කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව හොඳම යොවුන් නව කථාව හා හොඳම ළමා නව කථාව රචනා කරන අප දරුවන්ව දිරිමත් කිරීමක් හැටියට ඒ පොත් මුද්‍රණය කරන්නට අත හිත දෙන අතරම වටිනා ත්‍යාගද පිරිනැමීමට බලාපොරොත්තු වෙනවා. නව කතා පමණක් නොවෙයි, හොඳම ළමා හා යොවුන් කෙටි කතා, දහම් පැනට පිරිනමන ත්‍යාගය, හොඳම පද්‍ය නිර්මාණ ග්‍රන්ථ මෙන්ම චිත්‍ර කතා වලටත් මෙලෙසින්ම අත හිත දීමට අපි සූදනම් බව පවසන්නේ ඉතාමත් නිහතමානිවයි. මේ සියල්ල සූදනම් වන්නේ අපේ පුවත්පත්වල සංවත්සර මුල් කරගෙනයි. ඒ නිසා අපේ කතෝලික පුවත්පත්වල පාඨක , ලේඛක, පිරිසක් හැටියට ඔබ මේ සියල්ල සිත්හි නිදන්ගත කොට ඒවා ක්‍රියාත්මක කරන්නට යුහුසුළු වීම අත්‍යාවශ්‍යයි.

ආදර දුවේ, පුතේ, ''ළමා ප්‍රදීපය මහත් අභිමාන යෙන් සිය පස්වෙනි සංවත්සරය සමරන කොට මේ සියල්ල මතක් කොට ඔබව දිරිමත් කරන්නට අපි බලාපොරොත්තු වුනේ ඒ නිසයි. ඉතින් ළමා ප්‍රදීපය දැන් ළදරු වියෙන් ළමා වියට එළඹිලා එහි සිට සිය යොවුන් විය වැළඳ ගන්නට ආදර යෙන් බලා සිටින නිසා එය වටා රොඳ බැඳ ගන්නා ආදරණීය දරු කැලක් හැටියට ඔබත් ශක්තිමත් වී අපවත් ශක්තිමත් කරන්න කියා ඉතා නිහතමානීව ආදරයෙන් ඉල්ලා සිටිනවා.

**"ළමා ප්‍රදීපය" සැමදු දිනේවා !**

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




# අපගේ ආදි මවු පියෝ

**ප්‍ර:** දෙවියන් වහන්සේ මැවූ පළමු වන පුරුෂයා සහ ස්ත්‍රීය කවුරු ද?

**උ:** ආදම් සහ ඒව යන දෙදෙනාය. ඔව්හු අපගේ ආදි මවු පියෝ ය.

❖ **ප්‍ර:** දෙවියන් වහන්සේ අපගේ ආදි මවුපියන්ට කුමන උතුම් වරම් දුන් සේක් ද?

**උ:** දෙවියන් වහන්සේ අපගේ ආදි මවුපියන් තමන් වහන්සේට ආදරයෙන් කීකරුව සිට ස්වර්ග රාජ්‍යයට යන පිණිස දේව ඉෂ්ඨ ප්‍රසාදය නම් දේව ජීවනය ඔවුන්ට දුන් සේක.

❖ **ප්‍ර:** දේව ඉෂ්ඨ ප්‍රසාදය නිසා ආදම් සහ ඒවට ලැබුණේ කුමක් ද?

**උ:** මේ උතුම් වරම නිසා ආදම් සහ ඒව දෙවියන් වහන්සේගේ දරුවන් වෙමින් නිර්දෝෂ භාවය ලබාගෙන උන්වහන්සේට ප්‍රසන්න වුණෝය.

❖ **ප්‍ර:** ආදම් සහ ඒව මේ උතුම් වරම් නැතිකර ගත්තේද?

**උ:** ආදම් සහ ඒව දෙවියන් වහන්සේට අකීකරු වී එම උතුම් වරම නැතිකර ගෙන දේව දරුකම ද අහිමි කර ගත්තෝය.

❖ **ප්‍ර:** ආදම් ගෙන් පැවත එන පාපය කුමක් ද?

**උ:** ජන්ම පාපය ය.

❖ **ප්‍ර:** ජන්ම පාපය හේතු කොට ගෙන සැම මනුෂ්‍යයකුටම සිදු වන්නේ කුමක් ද?

**උ:** දේව ඉෂ්ට ප්‍රසාදය හා දේව දරුකම නැතිව මවු කුසෙහි පිළිසිඳීම ය.

❖ **ප්‍ර:** ආදම් පව් කළ පසු දෙවි පියාණන්වහන්සේ මනුෂ්‍යයන්ට ප්‍රේමය සහ දයාව පෙන්වූයේ කෙසේ ද?

**උ:** මනුෂ්‍යයන්ට නැවත දේව ඉෂ්ට ප්‍රසාදය ද, දේව දරුකම ද ලබා දෙන පිණිස තමන් වහන්සේ ගේ පුත්‍රයාණන් ගැළවුම් කාරයාණන්කොට මෙලොවට එවන්නට පොරොන්දු වූ සේක.

❖ **ප්‍ර:** දෙවියන් වහන්සේ යමකු ජන්ම පාපයෙන් ආරක්ෂා කළ සේක් ද?

**උ:** දේව පුත්‍රයාණන් ගේ මවු වීමට සිටි කන්‍යා මරියාවන් පමණක් ජන්ම පාපයෙන් ආරක්ෂා කළ සේක.

❖ **ප්‍ර:** කන්‍යා මරියාවන්ට ලැබුනු මේ උතුම් වරමට කියන නම කුමක් ද?

**උ:** නිර්මල පිළිසිඳීම ය.

❖ **ප්‍ර:** කන්‍යා මරියාවන් ජන්ම පාපය නැතිව පිළිසිඳුන මංගල්‍ය සිදු කරන්නේ කවදා ද?

**උ:** දෙසැම්බර් 8 වන දින ය.

# භාවනා කරමු

## පළිගැනීමේ චේතනාවෙන් සිටින විට කරන භාවනාවක්

1. නිහඬ පරිසරයක සුදුසු ස්ථානයක් තෝරා ගන්න.
2. ඔබ පළිගැනීමකට යොමු කරන සිදුවීම සිහිපත් කර ගන්න.
3. එම සිදුවීම තුළින් ඔබ පළිගැනීමකට යොමු කරන පුද්ගලයා හා හිත රිදවූ වචන මතක් කරගන්න.
4. මෙම පාඨයට අවධානය යොමු කරන්න.'ඇසට ඇසය දතට දතය යන කීම ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. එදිරිකාරයාට විරුද්ධව එකට එක නොකරන්න. යමකු ඔබේ දකුණු කම්මුලට ගැසුවොත් ඔහුට අනිත් කම්මුලද හරවන්න''
5. ඔබ පළිගන්නට සිතා සිටින පුද්ගලයාව සිතින් මවා ගන්න. ඔහු දිහා මඳ වේලාවක් බලාගෙන ''මම ඔබගෙන් පළිගන්නෙ නෑ ඉවසනවා ''කියා ඔහුට කිහිපවරක් කියා සිත සැහැල්ලු කර ගන්න.
6. ශරීරය කෙළින් තියාගෙන පහසු ඉරියව්වකට වාඩිවන්න ඇස් දෙක පියාගන්න.
7. අවට පරිසරයෙන් ඇසෙන ශබ්දවලට සවන් දෙන්න. (කිසි දෙයක් ගැන සිතන්න එපා.)
8. හෙමින් හෙමින් ඔබගේ හුස්ම කෙරෙහි අවධානය යොමු කර මඳ වේලාවක් රැඳී සිටින්න.
9. ඔබ පළිගන්නට සිතූ පුද්ගලයාව සිතින් මවා ගෙන ඔහු දිහා බලාගෙන හුස්මයේ රිද්මයට අනුව ''මම ඉවසනවා''කියා නැවත නැවත සිතින් කියමින් ගැඹුරු (ඇතුලාන්ත) නිහඬතාවයකට යොමු වන්න. ඇතුලාන්ත නිශ්චල බව හා සාමකාමී බව අත්දකින්න.
10. අවධානය බිඳුනොත් නැවත හුස්ම කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් නිහඬතාවයකට ඇතුලත් වන්න
11. භාවනාව අවසානයේ ජේසුට ස්තුති කර යාච්ඤාවක් හෝ ගීතිකාවක් කියන්න
12. භාවනාව පිළිබඳව පුංචි ඇගයීමක් කරන්න.

මෙලෙස විවිධ සුවිශේෂ පාඨගෙන තනිවම භාවනා කරන්න ඉගෙන ගන්න.

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය

# "මොකක්ද? මේ ළමා ප්‍රදීපය කියන්නේ"

''මොකක්ද අනේ මේ පත්තරේ සඟරාවක් වගේ''.
නෑ මේ අපේ ආගමේ දරුවන්නේ පත්තරයක් ''
ලීනයි, යසවතී යි, බස්එකේ වක්කඩේ කැඩුවා වගේ වචන හරඹයක . යසවතී අන්‍යාගමික කාන්තාවක් . ලීනා කතෝලික කාන්තාවක්. මේ දෙන්නාගේ මේ දෙබස තමන්ගේ දරුවන් දෙදෙනා පාසලට ඇරලවල ගෙවල්වලට යන ගමන් බසයට ගොඩ වෙලා. දෙන්නා යාළුකම් පටන් ගත්තේ දරුවන් පාසලට ඇරලවන්න ඇවිල්ලයි. යසවතී පත්තර ගොන්නක් බඳුගෙන හිටිය නා,නා ප්‍රකාර වෛවර්ණ ඡායා රූප , ලිපිවලින් පිරිච්ච, දැන්වීම් දහක් විතර තිබෙන පත්තර මිටිය වුනාට ඒ සියල්ලම එක පත්තරයක පිටු.



''හැබෑට මොනවද ඔය පත්තරේ තියෙන්නේ'' යසවතීගේ කටහඬ ඒ. ''අපේ දරුවන්ට හොඳ ආදර්ශමත් පත්තරයක් හරිම වැදගත් දේවල් මේකෙ ඉගෙනගන්න තිබෙනවා'' ලීනා කිව්වා ''කෝ බලන්න පොඩ්ඩක් මෙහාට දෙන්නකෝ'' සංස්කාරක පිටුවෙන් පටන් අරන් ''ඥනෝපදේශය'', ''භාවනා කරමු'' , ''පිපෙන මල් යාය'' ''අපේ සමිති'' ''අ.පො.ස සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව හරහා '' ''ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය'' ''ඉංග්‍රිසි පාඩම '' ''චිත්‍ර පිටුව '' ''සුදුවර චරිතය'' ''ප්‍රහේළිකාව'' චිත්‍රකථාවේ සිට අන්තිම පිටුව උඩින් පල්ලෙන් ආවා යසවතී.

''මේ ඒක නොවේ මට මේ පත්තරේ පොඩ්ඩක් දෙනවද? බලලා හෙට ඔයාටම ගෙනවිල්ලා දෙන්නම්'' ලීනාට හා කියන්නත් බැහැ. බැහැ කියන්නත් බැහැ. ''පුතා ආව ගමන් අහන්නේ ළමා ප්‍රදීපය ගෙනවාද? කියලා. කමක් නැහැ මං පුතාට මොකක් හරි කියලා ජාමේ බේරා ගන්නම්කෝ.'' කියලා ලීනා කියයි. යසවතී එයාගේ පත්තරගොන්න මැදට තියලා මේ පුංචි පත්තරේ රෝල්කර ගත්තා. පහුවදා සුපුරුදු පරිදි දෙන්නා නැවත පාසල අසලදී හමුවුනා.

''ලීනා මෙන්න ඔයාගේ පුතාගේ පත්තරේ'' ලීනා පත්තරේ ගත්ත ගමන් අතේ බෑගයට ඒක ඔබා ගත්තා. ''ඒක නෙවි මං අපේ පුතාටත් පත්තරේ පෙන්නුවා බලන්න කෝ, අද කාලේ ළමා පත්තරයක් ගත්තත් ළමයින්ට අවශ්‍ය දේට වඩා වෙළඳ දැන්වීම් ඊට වඩා මේ පත්තරේ මං ආශාවෙන් කියෙව්වා. දැනුම වගේම තමන්ගේ ධර්මය තුළ ආදර්ශවත්ව ජීවත් වෙන හැටි කොයි තරම් ලස්සනට පැහැදිලි කරලා තියෙනවාද.? ඒ ටික කියලා නතර නොවිච්ච යසවතී ''බලන්නකෝ අද රට යන දිහාව මේක නම් ලෝක විනාසේ අපේ ආගමේ දරුවෙකුට කියලා යමක් කියවන්න තියනවාද? නැහැනේ. තියෙන්නේ මහ උන්ට විතරයි. පොඩි ඈයොන්ට කියවන්න මෙලෝ දෙයක් නැහැ. ඒකට ඔයාලාගේ දරුවන්ගේ හැමදේම පිළිවෙලයි. පැහැදිලියි ඉගෙනීම උනත් හරිම විනයක් තියන විදිහට වැඩ කරන්නේ. ආගම මොනවා උනත් මේ පත්තරේ මටත් ගෙනත් දෙන්න පුළුවන්ද? ලීනා. යසවතී ඇහැව්වා.
''ලබන සතියේ ඉඳල මං ගෙනවිල්ලා දෙන්නම්කෝ''
''ගාන කීයද?''
''රුපියල් දහයයි''
''පත්තරෙත් හුරු බුහුටියි මිලත් සාධාරණයි'' මේවා තමා දරුවන් වෙනුවෙන් සමාජයේ සාරධර්ම කියාදෙන ඇත්තෝ කරන්න ඕනා යුතුකම. ඒ අතින් ඔයාලා පොහොසත්. ඒ තමා ''ළමා ප්‍රදීපයේ හැටි'' ඕං බලන්නකෝ ඒකෙත් හැටි. අපිත් දන්නෙම නැතිව අවුරුදු 5 ක් ලබපු ''ළමා ප්‍රදීපයට'' ත් සමිඳුන්ගේ ආසිරිය පතා යාච්ඤා කරමුනේද? ඒ විතරක්යැ. ''ළමා ප්‍රදීපය'' මේ විදිහට හරබරව ලස්සනට හැඩ වැඩ කරල දෙන සංස්කාරක පියතුමන්ටත්, සියළුම කාර්යමණ්ඩලයටත් ශුධෝතුම් වරම් ඉල්ලා යාච්ඤා කරමු හොඳේ.

**ජුඩ් .ජේ. ප්‍රනාන්දු මාමා - ගෙලිඔය**

**මාසික සිතුවිල්ල**
**ඔක්තෝබර් මාසය - ජයග්‍රාහී නිර්මාණය**

සියුමැලි අත්පොඩි එක් කරලා
සිඟිති හදින් සැම පිබිදීලා
සොයුරු දමින් සෙල්ලම් කරලා
එක ඉත්තක පිපි මල් වීලා



**සේයා :- ශ්‍රියාංගනී පිලිෂියා**

ප්‍රසාදි ඉරෝෂනී පෙරේරා
9 ශ්‍රේණිය
වික්ෂෝප මාතා දහම් පාසල - ජා ඇල

"නොවැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

මාසික සිතිවිල්ල



**සේයා :- අශේන් එස්. සේනාරත්න**

# ළමා අපේ පත්තරය "ළමා ප්‍රදීපය " 5 වන සංවත්සරයට සුබ පැතුම්



මා බොහෝ දැනුම ලබා ගත්තේ ළමා ප්‍රදීපය කියවීමෙන්ය. ළමා ප්‍රදීපය කියවීමේදී බඳුනකට දිය බින්දුව බින්දුව වැටි බඳුන ජලයෙන් පිරෙන්නා සේ මම ද දැනුමේ ආලෝකයෙන් පිරුනෙමි. හැම දම හැමකෙනෙක් අතරම ළමා ප්‍රදීපය බැබළේවා !

**සඳුන් චාමර**
06 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - හාල්දඬුවන



අඳුරු වූ මා දිවියට
පහන් එළිය දැල්වුයේ ... ඔබයි
පස් වසරක් දිවි සරසවා
දැනුම ලබා දුන්නේ .....ඔබයි
මගේ දිවියේ දැනුමට
නැවුම් අරුතක් දුන්නේ .... ඔබමයි
පතමි හිතවත් ළමා ප්‍රදීපය
දින දින සැරදේවා .....!
දිගුකල් වැජඹේවා .....!

**චමත් ඉමාෂ කුරේ**
හබරණ



නවමු මුහුණුවරක් රැගෙන අප වෙත එන්නේ
සැම සති නිමාවකමයි අප අතරට එන්නේ
දැනුම සමඟ වින්දනයත් අරගෙන එන්නේ
දෙවිඳුන්ගේ ආසිරි නිති ඔබට පතන්නේ

පස් වසරක අභිමන් දැන් ඔබ සමරන්නේ
සැමගේ වැඩි දියුණුවටයි ඔබ වෙහෙසෙන්නේ
දරුවන්ගේ හැකියා නිති ඔබ පසසන්නේ
ළමා ප්‍රදීපය ඔබ සැම දින වැජඹෙන්නේ

**හිරුණි රංසිකා**
09 ශ්‍රේණිය
ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බටුගොඩ



ඉගෙන ගත් දේ බොහොමය
ඉගෙනුමට ඇති දේ බොහොමය
කිතුනු දිවියේ අරුත කියා දුන්නට
ස්තුතියි ළමා ප්‍රදීපයට

**ට්‍රෙවින් සෙරාන් පෙරේරා**
ශු. රෝකුස් මුනිඳුන්ගේ දහම් පාසල - ඇලතුර

ළමා ප්‍රදීපයයි අපේ දැනුම වඩන්නේ
ඉරිදා එනතුරු පෙරමඟ බලා සිටින්නේ
ප්‍රහෙලිකාවටයි මා සිත ඇදිලා යන්නේ
දහමේ හරයෙන් අප සැම පුරවා ලන්නේ

**වත්සලා නිර්මාණී දිසානායක**
09 ශ්‍රේණිය
ශාන්ත මරියා දහම් පාසල - වැල්ලවාය





පුංචි අපේ නිර්මාණ
වලට හැම විටම
ඉඩ දෙමින් අපව
දිරිගන්වන ඔබට දිගු ගමනක්
යාමට ලැබේවා !

**හිමංසලා මල්ෂානි**
3 ශ්‍රේණිය
නිමල මරියා බාලිකා විදුහල - තුඩැල්ල



# ළමා ප්‍රදීපය

"ළදරුවන් මා වෙතට එන්න ඉඩ දෙන්න" යනුවෙන් ප්‍රකාශකළ ජේසුස් ස්වාමින් වහන්සේ, ඒ බාල පරපුර යහමඟට, නව මාවත් පෙන්වමින් තම හැකියාවන් තවත් වර්ධනය කරගනිමින්, ළමුන්ගේ අදහස්, ධර්මදූතකාර්යයන් දරුවන්ට විවිධ චිත්‍රකථා, නිර්මාණ ඔස්සේ පහදා දෙමින්, ශු. බයිබලය පාදක කර ගනිමින් ප්‍රහේලිකාවෙන් දරුවන් දැනුම්වත් කරමින්, විශේෂයෙන් දරුවන්ට සැම සතියකම ආගමික හා ඉංග්‍රීසි පාඩම් මාලාවක් පළකරමින්, (අ.පො.ස සා.පෙළ.) ළමුන් සඳහා කිතුනු දරුවන් අතරට හැම සතියකම පැමිණෙන ළමා ප්‍රදීපයට වසර පහක් සපිරීම වෙනුවෙන් සුබ පතමි. වසර පහකට කලින් ඥනාර්ථ ප්‍රදීපය තුළ පළවූ "ළමා ප්‍රදීපය " දරුවන්ගේ දැනුම වර්ධනයට හා හැකියාවන්ට වැඩි ඉඩ කඩක් ලබා දෙමින් ළමා ප්‍රදීපය ලෙසින් ළමා පුවත් පතක් ලෙස දරුවන්ට ලැබීම, අප ලක් දෙරණෙ දරුවන් ලැබු දේව ආශිර්වාදයකි. එසේම ඒ ආශිර්වාදය එල ගන්වමින්, අප දරුවන්ගේ විවිධ දක්ෂතා, නිර්මාණ, ළමා ප්‍රදීපය තුළින් පෙන්විමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ලැබිම ද සතුටකි.

මා දයාබර දරු දැරියනි, ඔබ මෙම වැදගත් පුවත් පත නොගන්නා දරුවන්ටත්, (ඔබගෙ යහළුවන්ට) මෙහි ඇති වැදගත් කම කියා දී ළමා පුවත් පත ලබා ගෙන තම දැනුමට ඇති අවශ්‍යතාවය පහදා දෙන්න. ළමා පුවත්පත තව වැඩි කලක් පවත්වා ගැනීමට ඔබගේ , මගේ සහය නිතරම ලබා දිය යුතුය. කොළඹ අගරදගුරු පදවිය තුළ මෙන්ම අනෙකුත් පදවිවලද ශ්‍රී ලංකාවේ ළමා ධර්මදූත සමාජයන් වෙනුවෙන්, ධර්මදූත ළමා සමාජයන් වලට ළමා ප්‍රදීපය මගින් සිදුවන සේවාව වෙනුවෙන් මාගේ හද පිරි ස්තුතිය පුද කරන අතර, ළමා ප්‍රදීපයේ සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමන්ටද, සහය සංස්කාරක කුමර නයනජිත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටද ළමා ප්‍රදීපය පුවත් පත ළමුන් අතර වැඩි වශයෙන් ප්‍රකට කිරීමට දෙවියන් වහන්සේගෙන් ආශිර්වාදය මා ප්‍රර්ථනා කරමි.

**අසික ප්‍රියදර්ශන**

# යෙහෙන් වැජඹේවා



නැණරුත් පහන් දල්වන
සිතිවිලි පිවිතුරු කරවන
චර්යා දමින් ඔප් නංවන
ඔබ මිණි පහනකි හැමට
ළමා ප්‍රදීපයෙනි
සරල බසින් සිත් ඇදගෙන
කියවීමට රුකුල් දෙවන
දරු දේතට විගහින් එන
යහ මිතුරෙකි ගුණ වඩවන
ළමා ප්‍රදීපයෙනි
තව තව එළිය දෙන්න
ළමා ලොව බබළවන්න
සමරන පස්වන උපන්දින
දෙව් ආසිරියෙන් නැහැවෙන්න
පතනෙමි ඔබේ හිත පිරෙන්න
ළමා ප්‍රදීප මිතුරාණනි

**වෙක්ලා කල්දේරා** - දංකොටුව



# "ළමා ප්‍රදීපය" පස් වසරක අභිමානවත් ගමන් මඟට ප්‍රසාදය

"ළමා ප්‍රදීපය" අභිමානවත් අන්දමින් පස්වන වසර සැපිරීම ගැන මුල් යුගයේ "ඥනාර්ථ ප්‍රදීපය" සමඟ අතිරේකයක් වශයෙන් පල වෙද්දි එය තිඹිරි ගෙය කර ගනිමින් ලේඛන කලාවට පිවිසි අයකු වශයෙන්ද වර්තමානයේ "ළමා ප්‍රදීපය" පුවත් පතට ලිපි, ප්‍රවෘත්ති, හා ඡායාරූප සපයන වැඩිහිටි ලේඛකයකු වශයෙන්ද හද පත්ලෙන් නැගෙන සතුට හා ප්‍රසාදය ඇතිව මෙම සටහන තබන්නෙමි.

"ළමා ප්‍රදීපය" පුවත්පත අද පවතින තත්වයට පත් වීමට මූලික හේතුව වශයෙන් මා දකින්නේ එහි සංස්කාරක මණ්ඩලය පාඨක රුචිය දැන හැඳිනගෙන කටයුතු කිරීමයි. විශේෂයෙන්ම මෑතකදී "ළමා ප්‍රදීපය " ඉදිරියේදී යා යුතු ගමන් මඟ තෝරා බේරා ගැනීමට පළ කළ "මත විමසුම" අනුව වැඩිහිටි, ළමා සැම ඉදිරිපත් කළ ඍජු අදහස් සැළකිල්ලට ගනිමින් ගත් උදාර පියවර අතිශයින්ම අගය කළ යුතුය. ඒ ඒ පිටු , විශේෂාංග, ප්‍රවෘත්ති, ඡායා රූප ආදිය පිළිබඳව පාඨකයාගේ රුචිකත්වය අනුව ප්‍රමුඛතාවය දෙමින් පළ කරන්නට පියවර ගැනීම අගය කළයුතුය."ළමා ප්‍රදීපය" ළමා වියේ අයගේ පුවත්පත බව සැබෑය. එහෙත් දහම් ගුරුවරු මෙන්ම සෙසු ගුරුවරුන්, වැඩිහිටි පිරිසකුත් ඒ හා බැඳී සිටින බව "මත විමසුම" හෙළිදරව් කළේය

"ළමා ප්‍රදීපය" ළමුන්ට ආනන්දජනක අත්දැකීමක් ලබා දෙනු නොඅනුමානය. එය එසේ වන්නට සැලැස්වීම ගැන "ළමා ප්‍රදීපය" ගරු සංස්කාරක පියතුමන්ටත් සහය සංස්කාරකතුමන් ඇතුළු මීට දයක වන සැමටත් අපගේ ගෞරවනීය ප්‍රණාමය මෙසේ පළ කර සිටිමි. ළමා පුවත්පතක් අඛණ්ඩව පවත්වාගෙන යාම එතරම් ලෙහෙසි පහසු කර්තව්‍යයක් නොවේ. ඒ අසීරු කර්තව්‍යය පස් වසරක් පුරා මේ වන විට ඉටු වී ඇත. "ළමා ප්‍රදීපය" චිරාත් කාලයක් යෙහෙන් වැජඹේවා

**සී.ආර්.ඩික්සන් ඇන්ටනි මාමා.**

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 30

## මැරෙන තුරු ජීවිත රහස හෙළි නොකළ ලෝක මහ ක්‍රිස්තියානි සංගීතඥයා

පසුගිය ලිපිය හා සබැඳේ

ලුඩ්විග් ගේ විසිවෙනි වියේ දී ඔහුට යම් පමණ සැනසීමක් ලැබුණේ, කොලෝන් නුවර ඉතා ධනවත් පවුලක් ඔහුගේ මුළු මෙහෙය ලබා ගන්නට කැමැත්තෙන්, ඔවුන් සමග ජීවත්වීමට බිතෝවන් ද ඔහුගේ සොහොයුරන් දෙදෙනාට ද ආරාධනා කළ බැවිනි. එම ආරාධනය ඉතා සාදරයෙන් පිළිගත් සංගීත සූරයා, එම උසස් පවුලේ ලොකු කුඩා දරුවන්ට බොහෝ මහන්සි වී සංගීතය ඉගැන්වූයේය. මෙ සමයෙහි ඔහුට සිත් කරදර අඩු වූ බැවින් ඔහු නිර්මාණ ශක්තියෙන් අලංකාර සංගීත තාල රැසක් බිහි කළේය. එම ධනවත් පවුලේ මැතිනිය, බිතෝවන්ට මවක් ලෙස ප්‍රේම කළාය. සමාජයට කැපෙන ලෙස ඇඳුම් නො අඳින, හත් අට මසකට වරක් වත් කොණ්ඩය නො කපන, සමාජ සිරිත් විරිත් නොදන්න, ඒවාට ගරු නොකරන හදිස්සියෙන් කිපෙන සුළු මෙම තරුණයා ගේ දැඩි රළු ගති නැති කරන්නට ඈ උත්සහ කළාය. එහෙත් එයින් පලක් නැති විය.



ලුඩ්විග් වැන් බිතෝවන්

මෙම ධනවත් කරුණාවන්ත පවුල සමග ජීවත්වීම බිතෝවන්ට කරදරයක් නොවූවත්, ඔහු ගේ සංගීත කලාව වඩා පුළුල් කර ගැනීමටත්, දන්නා දෙයක් ලොවට දීමටත් ඔහු කැමති බව දැන ගත් එම පවුලේ ප්‍රධානියා බිතෝවන් නැවත වරක් ඕස්ට්‍රියාවේ ජාතික මහා ගායනා කණ්ඩායමේ නායකයා වෙත යැවූයේය. එවිට ඔහුට වයස විසි තුනකි. ඔහු බලාපොරොත්තු වූ උසස් සංගීත දැනුම යම් පමණකට එහි දී ඔහු ලබා ගත්තේය. වෙසෙසින් ම සංගීතයට අරුම පුදුම හැකියාවක් ඔහුට තිබෙන බව මෙහි දී සංගීත ලෝකය පිළිගත්හ. ඕස්ට්‍රියාවේ පමණක් නොව ප්‍රංශ දේශයේ ඉතාලියේ ඕලන්දයේ එංගලන්තයේ සංගීත කාමීහු බිතෝවන්ගේ මිහිරි හඬ ද, ගැයුම ද, වැයුම ද, ප්‍රස්තාර ලියුම් ද, අසන්නට, දකින්නට, බලන්නට, කියන්නට සතුටු වූවෝය.

සංගීතයට හිතැති රදළයන් ඔහුට ප්‍රේම කළේ, ඔහු වෙත ඇදී ගියේ බොහෝ විට කිසි ලැස්තියක් නොමැතිව පියානෝව හා රෞකිඤ්ඤදය ඔහු ගැසූ චමත්කාර විලාසයටය. මේ සමයෙහි ඔහු විවාහ ජීවිතයට ඇතුලත් වීමට කැමති වී, එක තරුණියක් සමග මිත්‍ර ධර්මයෙන් බැඳුණි. විවාහය ගැන එක් දිනක් ඔහු ඈට කථා කළ විට, ඇය ඊට අකමැති බව කීවේ මෙලෙසිනි, ලුඩ්විග්, මට සමාවන්න. ඔබට විවාහ ජීවිතය අයිති නැත. ඔබ විවාහ වී තිබෙන සංගීත කලාවෙන් දික්කසාද වුවොත්, මම ඔබ සමග විවාහ වෙමි. නොඑසේ නම් විවාහ වුවාට පසු ඔබෙන් මා බලාපොරොත්තු වන ප්‍රේමය ආරක්ෂාව හා සමාගම, කිසි කලෙක මට නොලැබේ. මා ඔබට ප්‍රේම කරන්නේ, ඔබ ගයන වයන කල්හි පමණි.''

බිතෝවන්ගේ සංගීත කලාවේ රන් යුග ඉල්ලම පෑදුනේ, ඕස්ට්‍රියාවේ රජ පවුල සමග ඔහු විසූ පස් අවුරුදු කාලයේදී ය. මේ වන තුරු සංගීත වාදනයට සංගීත ලොවේ තිබුණ තූර්ය භාණ්ඩයන් ගේ අඩු පාඩුව ද, එවකට තිබුණ තූර්ය භාණ්ඩ අංග සම්පූර්ණත්වයෙන් පිරිපුන් නොවී තිබුණ බව ද ඔහුට මනාසේ හැඟී ගියේය. ඔහුගේ නිර්මාණ ශක්තියෙන් ලියැවුන උසස් සංගීත ප්‍රස්ථාර වැයුමට උවමනා කරන සියලුම ශබ්ද ප්‍රකාශ කිරීමට ප්‍රමාණ වන නවක තූර්ය භාණ්ඩ ඔහුගේ ම නිර්මාණ ශක්තියෙන් මේ සමයෙහි සෑදෙව්වේය. පරණ තූර්ය භාණ්ඩයන්ට අලුත් කොටස් (ශබ්ද දෙන නලා) සම්බන්ධ කළේය. මෙයට උවමනා වූ මිල මුදල් රජ පවුල නො ගැන දුන්නේ ය. මෙ සමයේදී ඉතා වටිනා අමරණීය සංගීත තාල රැසක් ඔහුගෙන් බිහිවුනි. මුළු යුරෝපා මහා ද්වීපය බිතෝවන් ගේ නවක සංගීත භාණ්ඩයන් ගෙන් ද අරුම පුදුම මිහිරි තාලවලින්ද කුල්මත් විය.

ඒ සමයෙහි ඕස්ට්‍රියාවේ මහ රජුගේ ප්‍රධානත්වයෙන් ජාත්‍යන්තර මහා සංගීත කලා සම්මේලනයක් විය. එවකට ලොවේ ජීවත්ව සිටි මහා සංගීතාචාර්යයෝ මෙම කලා සම්මේලනයට පැමිණුණෝය. එහි දී ඕස්ට්‍රියාවේ රජ, බිතෝවන්ගෙන් ප්‍රශ්නයක් ඇසුවේය. ප්‍රශ්නය මෙය විය. ''සංගීත වාදනයේ ඇති රහස කුමක්ද?'' ගත් කටයම ඔහු දුන් උත්තරය මෙය ය. ''තූර්ය භාණ්ඩයේ උදව්වෙන් මිනිස් හදක් තවත් මිනිස් හදකට කථා කිරීමය, එතැන නිශ්චලව වාඩි වී සිටි මහළු මහා ගාන්ධර්ව මොසාට් අසුනෙන් නැගිට උඩ පැන පැන අත් පොලසන් දෙමින් මෙසේ කීය. ''ඉතා කොටට රසට හරියට ම හරියට වාදනය කුමක්ද කියා විස්තර කළා, මට වඩා සමත් මගේ ගෝලයා ගැන මම ඉතා ආඩම්බර වෙමි''

සංස්කාරක පියතුමන් විසිනි

ඉදිරියට .......

# කිතුනු උරුමය

# ලෝකයේ ඉපැර

## ඩුරා යුරෝප්‍රස් දෙව්මැඳුර



ක්‍රිස්තු වර්ෂ තෙවන සියවසේ සිරියානු බිමේ පිහිටි ඩුරා යුරෝප්‍රස් නම් නගරයේ ඉදිවූ කිතුනු නිවාස දෙව්මැඳුරකි මේ. ක්‍රි.ව.235 දී ඉදිව ඇතැයි සැලකෙන අතර 1920 හා 1930 වසර වලදී ප්‍රංශ හා ඇමෙරිකාන පුරාවිද්‍යාඥයන් කළ කැනීම් වලදී සොයා ගන්නා ලදී.

දැනට ලෝකයේ ඉතිරිව ඇති ඉපැරණිතම දේවස්ථානය ලෙස මෙය සැලකේ. විශාල ශාලාවකට යාබදව නිවසක් පැවතීම නිසා මෙය නිවාස දෙව්මැදුර ලෙස හැඳින්වේ. බෞතිස්ම ස්නාපන ශාලාවේ ඇති චිත්‍ර පෞරාණික අගයක් ගනී.

## මෙගිඩ්ඩු



ඊශ්‍රායලයේ ටෙල් මෙගිඩ්ඩු හි තිබී සොය
ඉපැරණි දෙව්මැඳුර ලෙස සැලකේ. 200
විද්‍යාඥයකු වන යෝටාම් ටිප්පර් සොය
අධිරාජයන්ගේ පීඩන සමයේ තිබු එකක්
සිත්තමක් එහි තිබී සොයාගෙන ඇති අ
යන්න එහි ලියැවී ඇත.

## සාන්ත පියරේ ඔක්ස් නොන්නායින්ස් බැසිලිකාව

ප්‍රංශයේ මෙට්ස් හි පිහිටි මේ බැසිලිකාව ක්‍රි.ව. 380 දී ගොඩ නැගූ යුරෝපයේ ඇති ඉපැරණිතම දෙව්මැඳුරු වලින් එකකි. සත්වන සියවසේදී බෙනදික්තාන තාපසාරාම යැදුම් කුටියක් ලෙස භාවිත කැරිණි. දහසය වැනි සියවසේදී බඩු ගබඩාවක් වූ අතර 1970 වසර දක්වා රංගශාලාවක් හා ප්‍රදර්ශන ශාලාවක් විය.



# ණීම දෙව්මැඳුරු

ශිරාන් මෛත්‍රී විසිනි

## ඩු දෙව්මැඳුර



ාගත් මෙගිඩ්ඩු දෙව්මැදුර ඊශ්‍රායෙලයේ වඩාත්
)5 දී ඊශ්‍රායෙල් තෙල්අවීව් සරසවියේ පුරා
) ගත් මේ දෙව්මැදුර තෙවන සියවසේ රෝම
 ලෙස සැලකේ. විශාල ප්‍රමාණයේ මොසැයික්
තර ''ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙවිඳුණෝය''

## සා. සියොන් ශ්‍රී මරිය තුමියගේ දෙව්මැඳුර



ඉතියෝපියාවේ වඩාත්ම වැදගත් දෙව්මැදුර වන මෙය ඉතියෝපියාන ඕතඩොක්ස් සභාවට අයත්වේ. පළමු ඉතියෝපියානු කිතුනු අධිරාජයා වූ එසානා විසින් සිවුවන ශත වර්ෂයේදී ගොඩ නංවන ලදැයි සැලකේ. කලින් කල විනාශවෙමින් යළි ඉදිවූ මේ දෙව්මැඳුරද ලොව ඓතිහාසික දෙව්මැඳුරු අතර ඉතා වැදගත් තැනක් ගනී.

**තවත් කොටසක් ලබන සතියේ**

ලෝක කතෝලික ජනගහනය ලිපි පෙළේ චීනයේ ජනගහනය 1,306,314,000 ලෙස හා කතෝලික ජනගහනය 9,797,353 ලෙස අලුත්ම වාර්තාවල දැක්වෙන බව කරුණාවෙන් සලකන්න. - මෛත්‍රී -

## සාන්ත මහා අන්තෝනි මුනි තාපසාරාමය

ඊජිප්තුවේ නැගෙ
නහිර කාන්තාරයේ මේ
තාපසාරාමය පිහිටා ඇති
අතර එහි පිහිටි වඩාත්
පැරණි දෙව්මැඳුරද
මෙය ලෙස සැලකේ.
මහා අන්තෝනි තුමා
ඊජිප්තුවේ තවුස් දම්
පුරමින් කාන්තාරයේ
බවුන් වැඩීමට මෙතැන
යොදාගෙන තිබිණ.
මේ තාපසාරාමය ද
කෝප්ටික් ඕතඩොක්ස්
සභාවේ ඓතිහාසික
උරුමය සනිටුහන්
කරන්නකි.





# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 115

අපි **'to', 'for'** සහ **'so that'** පිළිබඳව කතා කළා. අපි තව දුරටත් **'for'** ගැනත් **'to'** සහ **'for'** වැකිවල යෙදෙන හැටි ගැනත් බලමු.

දැන් බලන්න මේ වැකි දිහා. මේ පහත වැකිවල **to** සමග ක්‍රියා පදයක් සහ නාම පදයක් යන දෙකම යෙදී තිබෙනවා.

**to + verb**   **to + noun**

**නිදසුන් :**

They went **to the river** ***to bathe.***
(දේ වෙන්ට් ටු ද රිවර් ටු බේද්)
ඔවුන් ගඟට ගියා නාන්න
to the river = to + noun
to bathe = to + verb

He wanted **to speak** ***to the principal.***
(හී වෝන්ටඩ් ටු ස්පීක් ටු ද ප්‍රින්සිපල්)
මුල් ගුරුතුමියට කතා කිරීමට ඔහුට අවශ්‍යව තිබුණා.

Amal is going **to the post office** ***to post*** a letter.
(අමල් ඉස් ගොයිං ටු ද පෝස්ට් ඔෆිස් ටු පෝස්ට් අ ලෙටර්)
අමල් ලියුමක් දාන්න තැපැල් කන්තෝරුවට යනවා)
(to the post office = to + noun)
(to post a letter = to + verb)

Genny is trying **to go** ***to Canada.***
(ජෙනී ඉස් ට්‍රයිං ටු ගෝ ටු කැනඩා)
ජෙනී කැනඩාවට යන්න උත්සාහ කරමිනුයි ඉන්නේ)
(to go = to + verb)
(to Canada = to + noun)

My mother went **to the super market** ***to buy*** some food items.
(මයි මදර් වෙන්ට් ටු ද සුපර් මාකට් ටු බයි සම් ෆුඩ් අයිටම්ස්)
මගේ අම්මා කෑම ද්‍රව්‍ය වගයක් ගන්න සුපර්මාකට් එකට ගියා
to the super market = (to + noun)
to buy = (to + verb)

Mr. Perera will go **to Jaffna** ***to learn*** Tamil.
(මිස්ටර් පෙරේරා විල් ගෝ ටු ජැෆ්නා ටු ලර්න් ටැමිල්)
මිස්ට පෙරේරා දෙමළ ඉගෙන ගන්න යාපනයට යනවා.
to learn = (to + verb) to Jaffna = (to + noun)

දැන් අපි බලමු 'for' යෙදෙන විදිහ. සාමාන්‍යයෙන් for යෙදෙන්නෙ "සඳහා" කියන අදහස ප්‍රකාශ කිරීමට.

* I am going to N'eliya **for a holiday**
(අයැම් ගොයිං ටු නුවරඑළිය ෆොර්) අ හොලිඩේ)
මම නිවාඩුවකට නුවරඑළි යනවා. (නිවාඩුවක් සඳහා)
(නුවර එකළියට නිවාඩුවක් සඳහා කියන අදහස.

I am going **to a holiday** කියන්න බෑ වැරදියි. ✗
I am going **for N'eliya** කියන්නත් බෑ වැරදියි. ✗

* What would you like **for dinner?**
(වට් වුඩ් යූ ලයික් ෆොර්) ඩිනර්)
රෑ කෑමට මොනවද කැමති. (රෑ කෑම සඳහා)

What would you like **to eat?**
(වට් වුඩ් යූ ලයික් ටු ඊට්)
මොනවද කන්න කැමති?

What would you like **to dinner** කියන්න බෑ වැරදියි. ✗

dinner කියන්නෙ නාම පදයක් වුනාට ඒක to සමග යෙදෙන්නෙ නැහැ. ඒකෙන් අදහස් වෙන්නෙ to සමඟ හැම නාම පදයක්ම යෙදෙන්නෙ නැති බවයි. එසේ යෙදෙන හෝ නොයෙදෙන යෙදුම් භාවිතයෙන්ම පොත පත පරිශීලනයෙන් උගත යුතු වෙනවා.

let's go **to the** river **to swim.** (නිවැරදියි) ✓
(ලෙට්ස් ගෝ ටු ද රිවර් ටු ස්වීම්)
අප පීනන්න ගඟට යමු
Let's go **to the river for a swim.** (නිවැරදියි) ✓

I am going **to bathe.** (නිවැරදියි) ✓
(අයැම් ගොයිං ටු බේද්)
මම නාන්න යනවා.

I am going **for a bath.** (නිවැරදියි) ✓
(අයැම් ගොයිං ෆොර් අ බාත්)
I am going **for bath.** (වැරදියි) ✗

# ළමා ලේඛක වැඩමුළු

## කොළඹ පදවිය

මීරිගම ශු. ජපමාල දේව මාතා දෙව්මැදුරට අයත් දහම් පාසලේ 6 ශ්‍රේණියේ සිට ඉහළ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 නොවැම්බර් 10 වන ඉරුදින මීරිගම දෙව්මැඳුරේදී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.




- දෙවිඳුන් තුළට අපි ළං වුනෙමු.
- කියවීම පුරුදු වුනෙමු.
- දැනුම වර්ධනය කර ගන්නෙමු.
- හොඳ නරක ඉගෙන ගන්නෙමු.

මේ සැමටම ස්තුතිය.

**නිපුන් තිළිණ - 6 ශ්‍රේණිය**
සා. ජෝසප් විදුහල වත්තල ශාඛාව

- මම ආදරය කරන පත්තරය
- මට හොඳ නරක කියාදෙන පත්තරය
- ජේසු ගැන කියා දෙන පත්තරය
- මට නැඟිටින්නට කියා දෙන පත්තරය
- මම කැමතිම පත්තරය




**නිර්මාල් නවෝද්‍යා - 3 ශ්‍රේණිය**
සා. ජෝසප් විදුහල වත්තල ශාඛාව

# දිගු ගමනකට ආසිරි



ළමා ප්‍රදීපයේ 5 වන සංවත්සරයට සුභ පැතුමක් එක් කිරීමට ලැබීමත් දේව වරප්‍රසාදයක් ලෙස සළකමි. සැම අංශයකින්ම දුෂ්කරතා මධ්‍යයේ ජීවත් වන අතැඟිලි හා සමාන කතෝලිකයන් පිරිසක් ජීවත් වන "වැල්ලවාය" වැනි කුඩා මීසමක දරු දැරියන් හට දහමේ හරය බෙදු දෙන දහම් පාසල් හා පාසල් ගුරුවරියක ලෙස ළමා ප්‍රදීපය තුළින් කෙරෙන මෙහෙවර අගයන්නේ ඉතා කෘතවේදීව ය.

ප්‍රදේශයෙ ඇතැම් පාසල් වලද දහම ඉගැන්වීම සඳහා අවස්ථාවක් නොමැති වීම, දේවස්ථානයේ, දහම් පාසලේ හා ස්වයං අධ්‍යයනයේ උපකාරයෙන් පමණක් අ.පො.ස (සා.පෙළ), අ.පො.ස (උ.පෙළ) හා වෙනත් ආගමික විභාගවලට පෙනී සිටින සිසු දරුවන් හට විශාල අත්වැලක් ලෙස මම "ළමා ප්‍රදීපය" දකිමි. පහසුකම් සහිත නගර හා පාසල් වල දරුවන් හා සමානවම වැල්ලවායෙ දරුවන්ද එම විභාග වලින් පය ගැනීමට ළමා ප්‍රදීපයද තම දයකත්වය මැනවින් දක්වයි. අන්තර්ජාලයෙන් තම දැනුම දියුණුකර ගන්නා මෙවන් යුගයක රේඩියෝවක් හෝ නොමැති, තිබුණද ක්‍රියාත්මක කිරීමට විදුලිය පවා නොමැති වැල්ලවාය වැනි පළාතකට "ළමා ප්‍රදීපය" මිණි පහනක්ම වන්නේය.

අප දහම් පාසලේ සියළුම දරුවන් අතර ළමා ප්‍රදීපය බෙදී යන අතර ඔවුන් ඒ තුළින් ලබන දහම් පන්නරය, අප ආදර ජේසු තුමන් කුරුසියේ දිවි පුදමින් පැතු දේව රාජ්‍යය ගොඩ නැංවීමට මහත් අත්වැලක් වනු ඇත.පුවත්පතේ කටයුතු කරන සියළුම දෙනාහට දේව ආශිර්වාදය, නිරෝගී සුවය හා ප්‍රඥව නොඅඩුව ලැබේවා.

**ප්‍රියංගනී පෙරේරා - (ප්‍රධාන ආචාර්ය)**
ශා. මරියා දහම් පාසල - වැල්ලවාය

# ජාතික කතෝලික ලේඛක හවුලෙන් ළමා වැඩමුළුවක්

ජාතික කතෝලික ලේඛක හවුල මගින් පසුගියද ජා ඇල ශාන්ත මරියා විදුහලේදී ළමා ලේඛක වැඩමුළුවක් සංවිධානය කෙරිනි. ජා ඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් ජාතික කතෝලික ලේඛක හවුලේ හිටපු ලේකම් මැක්සිමස් රෝයි පෙරේරාගේ සංවිධායකත්වයෙන් ජා ඇල ශා.මරියා දහම් පාසලේ විදුහල්පති සමන්ත පෙරේරා මහතාගේ සහ ගුරුමණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් පැවැති මෙම වැඩමුළුවට ළමෝ 67 ක් සහභාගි වූහ.

මෙහිදී නිවැරදිව බස හැසිරවීම ගැන කැලිස්ටස් ජයමාන්න මහතාද, පුවත්පත් කලා ඉතිහාසය හා නිර්මාණකරණය ගැන පීටර් කැනියුට් පෙරේරා මහතාද දේශන පැවැත්විය. මීසම් සේවක පියතුමන් විසින් ළමුන්ට සහතික පත් පිරි නමන අයුරු මෙහි දිස්වේ. **සටහන - මැක්සිමස් රෝයි පෙරේරා**



**සේයා - ආර් ජෝශප් ප්‍රිය**



**ශු. දොමිනික් සාවියො මුනිතුමා**

ධීෂණා උත්කර්ෂි පෙරේරා
04 ශ්‍රේණිය
සා. බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



**මෝස්තරයක්**

පැහැසරා ඉදුමිණි වික්‍රමසිංහ
01 ශ්‍රේණිය
ශා. ආනා දහම් පාසල
වත්තල

**මල් පැනි බොන සමනළයෙක්**

තරුෂිකා නෙත්මි
04 ශ්‍රේණිය
සිරි කුරුස විදුහල
ගම්පහ



**අපගේ ආත්මික භෝජනය**

ශෙරින් බර්නදෙත් පෙරේරා
09 ශ්‍රේණිය
නිර්දෝෂ දේව මාතා දහම් පාසල
නිවන්දම
(මිදෙල්ලවිට මීසම)





**සුන්දර ගම්මානයක්**

තරුෂි ඉමායා
මතුගම
06 ශ්‍රේණිය
නිර්මල හෘදයේ දේවමාතා දහම් පාසල
බංඩිගොඩ
(බටගම මීසම)



**දේව අම්මා**

රූත් ප්‍රනාන්දු
12 ශ්‍රේණිය
(කලා අංශය)
ආවේ මරියා බාලිකා විදුහල - මීගමුව

# ස්මිර්නාහී පොලිකාප් පාප්තුමා



සුදුවර චරිත

මෙතුමා ක්‍රි. ව. 63-150 දක්වා කාලය තුළ ජීවත් වු අපෝස්තලික පියවරුන් අතර ඉතා වැදගත් තැනක් හිමි කර ගනී. මොහුගේ ජීවිත කාලය නිශ්චිත වශයෙන් ක්‍රි.ව. 69/70 සිට 155/156 දක්වා දිව යන බව බොහෝ දෙනාගේ මතයයි. ඊට හේතුව ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් සමඟ ගැඹුරු සබඳ කමක් තිබු අයෙකු ලෙස නම් කර තිබීමය. මෙතුමා ජොහාන් අපෝස්තුළු තුමාගේ දේශන වලට සවන් දුන් කෙනෙක් වශයෙන්ද ඒවා උපයෝගි කරගෙන සභා ඉගැන්වීම් අර්ථවත් කළ කෙනෙක් ලෙස හැඳින්වේ. ඉරනේයස් තුමාට අනුව මෙතුමා ජුවාම් තුමාගේ දේශනාවලට සවන් දුන් අතර එතුමාව රදගුරු පදවියට අපෝස්තුළුවරුන් විසින්ම පත් කල බවට සඳහන් වේ. මෙලෙස ඔහු ස්මිර්නාහී රදගුරු වශයෙන් කටයුතු කළ බවට සාක්ෂි ඇත.



මෙතුමා විසින් ලිපි ගණනාවක් ලියා ඇතත් ලැබී තිබෙන සාක්ෂි අනුව සභාව අතට පත්වී ඇති විශේෂිත ලිපිය නම් ඔහු විසින් පිලිප්පි වරුන්ට ලියන ලද ලිපියයි. මෙය එක ලිපියක් ලෙස සටහන් වුවද එය එසේ නොවන බවත් එය බොහෝ දුරට ලිපි 2ක් වශයෙන් ලියවෙන්නට ඇතැයි පෙනී යන බව සභා ඉතිහාසඥයන් පෙන්වා දෙති. එතුමාගේ ජීවිතය පිළිබඳ අපට තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන මාර්ග 03 කි.

1 ඉග්නාසියුස් තුමා විසින්ම පොලිකාප් තුමා වෙත ලියන ලද ලිපිය

2 පොලිකාප් තුමා විසින්ම පිලිප්පිවරුන්ට ලියන ලද ලිපිය (ක්‍රි.ව.135)

3 ස්මිර්ණාවේ බැතිමතුන් විසින් මෙතුමාගේ ප්‍රාණ පරිත්‍යාගී වරය පිළිබඳ ලියන ලද ලේඛනය. (ක්‍රි. ව. 155-157)

පොලිකාප් තුමා හා ඉග්නාසියස් තුමා අතර දැඩි මිතුරු කමක් තිබු බවට ඔවුන්ගේ ලිපි අපට පෙන්වා දෙයි. පොලිකාප් තුමාගේ දේවධර්මය පිළිබඳ අදහස් බොහෝ දුරට ඉග්නාසියස් මුනිතුමාගේ අදහස් වලට සමාන බව පොලිකාප් තුමා ලියන ලද ලිපිය මගින් පැහැදිලි වේ. මොහුගේද දේව ධර්මය කේන්ද්‍රවී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ තුළය.

පොලිකාප් තුමාගේ ජීවිත කථාව පිළිබඳ අප දන්නේ අල්ප වශයෙනි. නමුත් එතුමාගේ ලිපි වලින් උන්වහන්සේගේ චරිත ගුණාංග, එතුමාගේ මරණය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. මෙතුමාගේ මරණය ගැන ස්මිර්නාවේ ක්‍රිස්තියානින් ලද අත්දැකීම් පිලෝමින් සභාවට යවා ඇති බව සභා ඉතිහාසඥයෝ සඳහන් කරත පොලිකාප් තුමා පිලිප්පිවරුන්ට ලියු ලිපියේ දේවධාර්මී ඉගැන්වීම් වලට මෙම ලිපිය ඉග්නාසියුස් තුමා පිලිප්පි සභාව බැහැදැකීමෙන් පසු පිලිප්පි වරුන් විසින් පොලිකාප් තුමාට යැවු ලිපියට පිළිතුරකි.

පිලිප්පි සභාව පොලිකාප් තුමා වෙත ලිපියක් යවමින් ඉග්නාසියුස් තුමා විසින් රචිත ලිපියේ පිටපතක් ඉල්ලා සිටි බව සඳහන් වේ. එසේම තව දුරටත් තම සංඝයේ විශ්වාසය ගැඹුරු කරන ලෙසට ඉල්ලා ඇත.

ඔහු විසින් පිලිප්පි වරුන්ට ලියන ලද ලිපියේ සඳහන් වන පරිදි සභා ශ්‍රේෂ්ඨයන්ගේ ඉගැන්වීම් විශ්වාසයෙන් යුතුව පිළිගත යුතු බවත් ඔවුන් කීකරු විය යුතු බවත් පාස්කු අභිරහස සහ එය පැවැත්විය යුතු ආකාරය, දිනය ගැනත් සඳහන් වේ. ඔහුගේ ලිපියේ දැකිය හැකි මුලික දේව ධර්මානුකුල ඉගැන්වීම් 4 කි.

1. වේද භේදීන්ගේ මිත්‍යා මත වලින් ආරක්ෂා කිරීම හා මාංශගතවීම හා මරණය ගැන සභා ඉගැන්වීම් ආරක්ෂා කිරීම.

2. සභා ව්‍යුහය ගැන කතා කරයි. සභා නායකයන් තුළ තිබිය යුතු මෘදු කාරුණික බව ගැනද කතා කරයි. විශේෂයෙන් සමාජය තුළ අසරණ වී ඇති ජනයාට සහා නායකයන් දැක්විය යුතු කාරුණික බව සඳහන් වේ.

3. කිතුණු ප්‍රේමය ගැන කතා කරන මෙතුමා දන්දීමේ ඇති වැදගත්කම ගැන පැහැදිලි කරයි.

4. සභාව හා අධිරාජ්‍යය අතර පැවැතිය යුතු සම්බන්ධකම ගැන කතා කරයි. මෙලෙස රජය පාලනය ගැන සභාවේ ඇති දැක්ම පැහැදිලි කරයි. මේවාට අමතරව විවාහ ජීවිතයේ යුතුකම්ද ගිහි /පැවිදි ජීවිතවල යුතුකම්ද මෙතුමා පැහැදිලි කරයි. 4 වන සියවස අගබාගයේදී මෙම ලිපිය පෙරදිග ආසියා යම් යම් ස්ථාන වල පැවැත් වු දේව මෙහෙයන්හි ප්‍රධාන කියවීමක් ලෙස යොදාගෙන ඇති බව සඳහන් වේ. ඔහු පුළුස්සා මැරීමට තැත් කළත් නොපිලිස්සුන නිසා වදකයා කඩුවෙන් ඔහුගේ ලයට ඇන මරා දැමු බව සඳහන් වේ.

මෙසේ ඔහුව මරා ඉන්පසු ගින්නේ පුළුස්සා ඇති බවටද සඳහන් වේ. මෙම මරණයට හේතුව රෝම දෙවිවරුන්ට පුද පුජා නොපැවැත්වීමත් රෝම අධිරාජ්‍ය දේවත්වයෙන් පිදීම ප්‍රතික්ෂේප කිරීමත්ය. ක්‍රි.ව. 150 දි ඔහුගේ මරණය සිදු වු බව අනුමාන කරයි.

**අසේල දසනායක විසිනි**

## ප්‍රහේලිකා අංක 41

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | 6 | 7 | | |
| 8 | 9 | ■ | | ■ | |
| ■ | | ■ | ■ | 10 | ■ |
| ■ | 11 | | | | ■ |

### හරහට

1. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වීමට ......... හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක, මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ශුද්ධවූ සභාවේ පනත් සංඛ්‍යාව

6. දෙවිපියාණන් අපට දී ඇති හැකියාවන් වර්ධනය කර දේව රාජ්‍යය වෙනුවෙන් යෙදවිය යුතු බව පෙන්වීමට ..... දසය පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තම ....සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේය. යනුවෙන් උපදෙශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

11. අග්‍රදූතයන්ගෙන් එක් කෙනෙකි.

### පහළට

1. සදෙම් සහ ගොමෝරා නුවරවල් .... වලක්වාලීමට ආබ්‍රහම් තුමා දෙවිපියාණන් ඉදිරියේ මැදිහත් විය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ විවිධ ප්‍රාතිහාර්යයන් නිසා උන්වහන්සේ පිළිබඳ පුවත...... පැතිරී ගියේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ගිනිගත් නොදැවෙන පඳුර මැදින් දෙවිඳුන් මෝසෙස්ට කථා කරමින් ''ඔබේ පාද වලින් ..... ගලවා දමන්න''. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ'යි වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ ..... ශු. පේදුරු තුමාට පැවරූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. බදු පොළේ සිටි මෙම අයකැමියාට ක්‍රිස්තුන් වහන්සේ ''මා අනුව එන්න ''යයි වදාළ සේක.

9. කානා නුවර විවාහ මංගල්‍ය අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ මේවා මිදි යුෂ බවට හැරවූ සේක.

10 මේවා ගසා මරා දැමීම සඳහා පව්කාර ස්ත්‍රීය මිනිසුන් විසින් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙන ආවේය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 5/27,18, 9/11 ශු. මාක් 1/40 , ශු. ජුවාම් 8, උපදේශකයා හෙවත් සිරාක් 3/6, උත්පත්ති18/16, නික්මයාම 3/5**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

# මීගමුව දිසා ධර්මදූත ළමෝ දෙව් මවුන් යදිති



මීගමුව දිසා ධර්මදූත ළමා සමාජයේ ළමෝ එක්ව ජපමාල රැළියක් පැවැත්වූහ. මීගමුව මහවිදිය දේවස්ථානයේ සිට කඩොල්කැලේ දේවස්ථානය දක්වා ළමුන් ජපමාලය උච්චාරණය කරමින් ගමන් කළ අතර අවසානයේදී පාතිමා දේව මාතාවන්ගේ දර්ශනය අඩංගු චිත්‍රපටයක්ද ප්‍රදර්ශනය කෙරිනි. මෙහිදී ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා ආරම්භක යාච්ඤා මෙහෙය පැවැත්වූ අතර ගරු ලින්ටන් ජෝශප් පියතුමන්ද ළමුන් ඇමතීය. ජපමාල මාසය තුළ ළමුන්ව වඩාත් දේවමාතාවන් වෙත සමීප කිරීමේ මූලික අරමුණින් යුතුව මීගමුව දිසා ධර්මදූත ළමා සමාජ අධ්‍යක්ෂ ගරු ගයාන් ප්‍රසන්ත පියතුමාගේ අනුශාසකත්වයෙන් සජීවක සජීවිකාවන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිනි. **රෝසරි ප්‍රියංගිකා**


ශුද්ධවූ බයිබලය
ඇසුරෙනි
මෝසෙස්
චිත්‍ර කථා රචනය ආනන්ද කලුදේරා
දෙබස් හා චිත්‍ර ඇස්.ඒ.රී. චන්ද්‍රආරච්චි
26
මෝසෙස් නැවත කබාය තුළට අත දමා පිටියට ගත් විට අතෙහි මතුවී තිබූ ලප කැළැල් මැකීගොස් තිබිණි...
දැන් දැක්කා නේද.. එහි බලය..
මට දැන් වැටහෙනවා ශ්‍රී දණ්ඩ සර්පයෙකු බවට පත් කළාට පසු ඔවුන් එය විශ්වාස නොකළොත් මේ අත පෙන්නූ විට ඔවුනට සත්‍යය වැටහෙයි..
ඔව්.. ඔවුන් කලින් කළ හාස්කම් දෙක විශ්වාස නොකළොත් නයිල් ගඟේ වතුර.. ටිකක් රැගෙන... පොළොවට වක්කරන්න.. එවිට එම.. වතුර ලේ බවට ..හැරෙයි...
මාගේ ස්වාමින් වහන්ස මම කොහොමද ඒ දේවල් කරන්නේ... මම කතාවට එතරම්.. දක්ෂයෙක්... නොවෙයිනෙ
හිතට ධෛර්යය ගනිං.. මෝසෙස්.. නුඹේ සහෝදරයාවන ආරොන් නුඹ වෙනුවෙන් ජනතාවට කතාකරයි..
මෝසෙස් බිය වුවද දෙවියන් වහන්සේ බොහෝ දිරිමත් කළ සේක...
මෝසෙස් මා නුඹේ සහෝදරයා වන ආරොන්ව මුණගැස්වන්නම්.
දැන් නුඹේ ශ්‍රී දණ්ඩත් රැගෙන ඊජිප්තුවට යන්න.....
මා නිරන්තරයෙම ..නුඹ සමඟ.. ....සිටිමි...
නුඹට අතර මගදී නුඹේ සහෝදරයා වන ආරොන් මුණගැසේවි...




# කිතු නැණ පහදාදුන් වසර පහක ධර්මදූතික ගමන

'ළමා ප්‍රදීපය' වසර පහ සපුරයි. ආසියාවේ ප්‍රථම හා එකම කතෝලික ළමා පුවත්පත වන 'ළමා ප්‍රදීපය' වසර පහක් පුරාවටම ලක්දිව කිතුනු දූ දරුවන්ගේ දහම් නැණ පහදමින්, ධාර්මික කිතුනු දිවියක් සඳහා මඟ පෙන්වන ලද සැබෑ ප්‍රදීපයකි. එහි නැණ ආලෝකය තවත් චිරාත් කාලයක් පුරා මේ ලක්දිව ධාර්මික කරමින් විහිදේවායි අපි පතමු.







